**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල ඒඩ්ස් සංරචකයේ 09 වන වටය (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතිය - 2014**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල ඒඩ්ස් සංරචකයේ 09 වන වටය (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 පෙබරවාරි 11 දින එළඹි අංක එස්ආර්එල්-එස්-11-ජී13-එච් දරන ප්‍රදාන ගිවිසුමේ 13 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකියනු ලබයි. ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස් නිවාරණය, පාලනය හා ප්‍රතිකාර සඳහා ජාතික වැඩසටහනේ කාර්යයන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව, එච්අයිවී/ඒඩ්ස් පාලන ව්‍යාපෘතියේ 6 වන වටය හා 9 වන වටය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය පිළිවෙලින් එ.ජ.ඩො. 1,300,930 ක් හා එ.ජ.ඩො. 4,956,930 ක්වූ අතර මුළු මුදලම මූල්‍යනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජනවාරි 01 දින ආරම්භ කළ අතර, එහි 06 වන වටයේ වැඩසටහන 2010 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර ඇත. 09 වන වටයේ වැඩසටහන 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තා වල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු එකග වන බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නිතී, රීතී හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 756 හී අවශ්‍යතාවයන්ට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අගය රු.63,694,541 ක් වූ ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූලාශ්‍රය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | වර්ෂය තුළදී අරමුදල් ලැබීම් | | 2014 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | | 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජීඑෆ්ඒටීඑම් | 4.96 | 629.46 | 0.68 | 89.18 | 0.66 | 86.22 | 2.64 | 334.15 |
| ශ්‍රී.ලං.ර | | | | 5.00 | | | | |
| එකතුව | 4.96 | 629.46 | 0.68 | 94.18 | 0.66 | 86.22 | 2.64 | 334.15 |

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) විස්තරාත්මක කාර්ය වැඩසටහනට අනුව ගෝලීය අරමුදල විසින් 2011 සිට 2014 දක්වා එ.ජ.ඩො මිලියන 3.98 ක් නිදහස් කිරීමට අපේක්ෂා කළ අතර එ.ජ.ඩො මිලියන 2.84 ක් ව්‍යාපෘතියට නිදහස් කර තිබුණි. එයින් එ.ජ. ඩො. මිලියන 2.64 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. රු. මිලියන 21.09 කට සමාන එ.ජ.ඩො 199,781 ක ශේෂයක් මහා භාණ්ඩාගාරයෙහි රඳවා ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘති කාලය සියයට 80 ක් අවසන් වීමෙන් පසුව අරමුදලින් රු.මිලියන 334 කට සමාන එ.ජ.ඩො මිලියන 2.64 ක් එනම් සියයට 53 ක් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව රු. මිලියන 295.31 කට සමාන එ.ජ.ඩො මිලියන 2.31 ක ප්‍රදාන ශේෂය ඉතිරි මාස 12 ක ව්‍යාපෘති කාලයේදී භාවිතා කළ හැකි ද යන්න සැක සහිතය.

## 3. භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) එච් අයි වී ආසාදිත රෝගීන් වෙත අවධානය යොමු කිරීම, රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම, අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ වෙනත් සේවා ලබා දීම ඒඩ්ස් සංරචකයේ ප්‍රධාන අරමුණ වුවත් ප්‍රතිවෛරස් ප්‍රතිකාර මධ්‍යස්ථාන 06 ක් පමණක් පිහිටුවා තිබුණි.

(ආ) එච් අයි වී වාර්ෂික සම්මේලනය 2014 ඔක්තෝබර් 16 සිට 18 දක්වා කොළඹ දී පවත්වා තිබූ අතර ඒ සඳහා රු. 999,934 කට සමාන එ.ජ.ඩො. 7,873 ක් ව්‍යාපෘතිය විසින් වියදම් කර තිබුණි. වාර්ෂික සම්මේලනය සඳහා ආරාධිතයින් 240 කට ආරාධනා කළද පුද්ගලයින් 128 දෙනෙක් පමණක් සහභාගී වී තිබුණි.

**3.3 මූල්‍ය පාලනය**

-------------

විගණනය සිදු කළ සමාලෝචනයේ දී ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස ව්‍යාපෘතියේ අයවැය ඇස්තමේන්තු භාවිතා කර නොතිබූ බවට හඳුනාගත් නිරීක්ෂණ පහත දක්වා ඇත.

(අ) ක්‍රියාකාරකම් 26 ක් සඳහා සිදු කළ එකතුව රු. 52,931,441 ක්වූ මුළු ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය තුළදී අදාල කාර්යයන් වෙනුවෙන් භාවිතා කර නොතිබුණි.

(ආ) අදාල බලය ලත් පාර්ශවයන්ගෙන් නිශ්චිත අනුමැතිය ලබා නොගෙන ක්‍රියාකාරකම් 26 ක් යටතේ සිදු කර ඇති අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ඉක්මවා රු. 4,857,284 ක් වැඩිපුර වියදම් කර තිබුණි.

(ඇ) ඊට අමතරව අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සලසා නොමැති ක්‍රියාකාරකම් 13ක් යටතේ එකතුව රු. 5,234,830 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂය තුළදී වියදම් කර තිබුණි. තවද ඒ සඳහා නිශ්චිත අනුමැතීන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරකම් 15 ක් සඳහා අයවැය ඇස්තමේන්තුවේ රු. 26,600,785 ක් ප්‍රතිපාදනය කර තිබියදීත් රු. 6,419,977 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.